**එකිනෙකා සමග සම්බන්ධ වුණ සමාජයක්**

# මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණු ආධාරක

## මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පිළිබඳ ජනතාව පුහුණු කිරීමට මගපෙන්වීමක්



Copyright © 2017 GSM Association

# 2 වන මොඩියුලය - වට්ස්ඇප් (Whatsapp)

# Bitesize Training

# ඒ කුමක්ද?

WhatsApp

ෆෝන්-එකෙන් WhatsApp පෙන්වන්න

'WhatsApp යනු පණිවුඩ යැවීමේ සේවාවකි. එය තරමක් දුරට SMS වගේ වන අතර, ඔබට හඬ පටිගතකළ පණිවුඩ (voice messages), ඡායාරූප පවා යැවිය හැක. එපමණක් නොව, එකවර පුද්ගලයන් සමූහයක් වෙත වුවද, මෙම පණිවුඩ යැවිය හැකිය."

"WhatsApp සඳහා භාවිතාවන්නේ ඉන්ටනෙට් දත්ත වන අතර, ඒ නිසා එය පණිවුඩ යැවීමට ඇති වඩාත් ලාබදායී ක්‍රමයකි. පණිවුඩ හුවමාරු කරගන්නා අය අතර ඇති දුර, මෙහි පිරිවැය වෙනස්වීමට බලපාන්නේ නැත. උදාහරණයක් ලෙස, ඔබේ පවුලේ අයෙකු හෝ මිතුරෙකු වෙනත් රටක සිටින අවස්ථාවකදී ඔබ WhatsApp මගින් පණිවුඩ හුවමාරු කරගැනීමේ දී වැයවෙන්නේ, ඔහු/ඇය ඔබේ නිවස අසලම නිවසක ඉන්නවා නම් වැයවන පිරිවැය ම ය."

## ඔබට ඕනෑවෙන්නේ මේවාය.

ස්මාර්ට් ෆෝන් එක



Whatsapp පෝස්ටර්

## එය යොදාගත හැක්කේ කුමක් සඳහාද?

"ඔබේ පවුලේ අය සහ මිතුරන් සමග, ඉතා පහසුවෙන් නිරන්තර සම්බන්ධතා පවත්වාගැනීමට ඔබට එය යොදාගත හැක."

"ඊට අමතරව, ව්‍යාපාරික සම්බන්ධතා ඇති අය/ සගයන්/පන්ති මිතුරන් හෝ ව්‍යාපාරික ගනුදෙනුකරුවන් වැනි පුද්ගල සමූහයන් සමග; භාණ්ඩ ප්‍රචාරණය කිරීම, උපදෙසක් ලබාදීම, පන්ති පාඩම් සටහන් හෝ පැවරුම් හුවමාරුකිරීම ආදිය සඳහා සම්බන්ධ වීමට ද මෙය යොදාගත හැකිය."

**පැහැදිලි කරන්න**: පුහුණුකරන්නා විසින් Whatsapp මගින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ සිය පෞද්ගලික උදාහරණ මෙන්ම, එය භාවිතාකරන්නේ කුමන කටයුතු සඳහා ද යන්න පැහැදිලි කරදෙන්න.

පුහුණුවෙන්නාට **එය අදාළ කරන්න**: පුහුණුවෙන්නාගේම ජීවිතයේ කටයුතුවලදී මෙය ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

## එය ක්‍රියාත්මක වෙන්නේ කෙසේද?

ෆෝන්-එක පුහුණුවන්නා අතට දී, මෙම පියවරවලට යාමට උදව්කරන්න




**තනි තනි පුද්ගලයාට පණිවුඩ යැවීමට Whatsapp භාවිතාකරන ආකාරය**

පෝස්ටරය පෙන්වා පියවරෙන් පියවරට යමින්, වචන පෙළක්/ ඡායාරූප හා පටිගත කළ හඬ හුවමාරු කරන ආකාරය පැහැදිලි කරදෙන්න.




**පුද්ගල සමූහයකට පණිවුඩ යැවීමට Whatsapp භාවිතාකරන ආකාරය**

පෝස්ටරය පෙන්වා පියවරෙන් පියවරට යමින්, සමූහයක් සමග අදහස් හුවමාරු කරගැනීම ආරම්භ කරන අන්දම පැහැදිලි කරදෙන්න.

## පුහුණුවෙන්න!

"**Whatsapp** භාවිතා කරන ආකාරය දැන් ඔබ දන්නවා, එය අවශ්‍ය වෙන්නේ කුමක් සඳහාද?"

**පුහුණුකරුවා**: පුහුණුවන්නන්ගේ ෆෝන්වල ඇති සම්බන්ධතාවලට (contacts) WhatsApp පණිවුඩ යවන ආකාරය, පුරුදුවීමට උපකාර කරන්න.

ඉඟිය: "WhatsApp විවිධාකාර ලක්ෂණවලින් (features) සමන්විතය. උදාහරණ වශයෙන්, ඔබට අන් අය වෙත ඇමතුම් ලබාගැනීමට හෝ ඔබේ සම්බන්ධතා සමග ඔබ සිටින ස්ථානයේ පිහිටීම හුවමාරු කරගෙන ඔවුන්ට එම ස්ථානය දැනුම්දීමට ද හැකිය.''

පැහැදිලි කරන්න : WhatsApp හා සමාන තවත් පණිවුඩ යැවීමේ සේවාවන් ඇති බව කියාදෙන්න. Messenger, WeChat හා Viber වැනි තවත් එවැනි සේවා ගණනාවක් ඇත.

# පෝස්ටර්,

# කටවුට් සහ

# තොරතුරු පත්‍රිකා

Icon Cutouts - WhatsApp









# WhatsApp තනි තනි පුද්ගලයාට පණිවුඩ යැවීම

## භාවිතා කරන්නේ කෙසේද?





# WhatsApp පුද්ගල සමූහයකට පණිවුඩ යැවීම

භාවිතා කරන්නේ කෙසේද?



# WhatsApp කරදරකාර අංක ‘බ්ලොක් කිරීම’ භාවිතා කරන්නේ කෙසේද?





# සහතිකය

**මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණුව**

සම්පූර්ණ කරන ලදී

දිනය

අත්සන් කරන ලදී



# සහතිකය

**මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණුව**

සම්පූර්ණ කරන ලදී

දිනය

අත්සන් කරන ලදී